ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No

ඔබේ අංකය / உமது இல. / Your No

දිනය / திகதி / Date: 2023-11-01

පැමිණිලි පාර්ශවය : ඒ.එන්.කටුවාවල මිය,
අංක : 62/121, "සෙනෙහස"
4 වන පටුමඟ, නාගොඩ,
කළුතර දකුණ.

වගඋත්තර පාර්ශවය : ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
අංක : 628, 10 වන මහල,
ජනජය සිටි ගොඩනැඟිල්ල,
නාවල පාර, රාජගිරිය.

පැමිණිලි අංකය : **HRC/4765/22**

පැමිණිල්ල :-

පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින්, ප්‍රකාශ කර ඇත්තේ, තමා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ ජ්‍යෙෂ්ඨතම මාණ්ඩලික නිලධාරිනියක් වන බවත්, 2009.07.01 දින සිට කොළඹ මහ නගර සභාවේ නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබන බවත්ය. තමා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික සේවයේ 1 වන පන්තියේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂක (තොරතුරු තාක්ෂණය) පුරප්පාඩු සඳහා අයදුම්කර ඒ සඳහා පවත්වන ලද තරග විභාගයෙන් ද සමත් වූ බවද දක්වා ඇත.

තවද, ඉහත තනතුර සඳහා එක් පුරප්පාඩුවක් පැවති අතර, එම තනතුරේ පුරප්පාඩු පිරවීම සිදුකළ යුත්තේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන සේවයේ ව්‍යවස්ථාව අනුව බවත්, එම ව්‍යවස්ථාවේ 7 වන කොටසේ බඳවා ගන්නා අනුපාතය යටතේ, 100% ක් සීමිත ධාරාවෙන් විය යුතු බවත්, සීමිත ධාරාවෙන් බඳවා ගැනීමට නොහැකි වන අවස්ථාවකදී විවෘත ධාරාව යටතේ බඳවා ගත හැකි බවත් සඳහන් කර ඇත.

කරුණු එසේ තිබියදී විවෘත ධාරාවෙන් බඳවා ගැනීම සඳහා තරග විභාගයක් පැවැත්වීමට කටයුතු යොදා තිබියදී පැමිණිලිකාරිය විසින් බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා වෙත කරන ලද අභියාචනයක් අනුව එම විවෘත තරග විභාගය අවලංගු කර ඇති බවද දක්වා ඇත.

කෙසේ වුවත් 2021.01.06 දින පවත්වන ලද සීමිත තරග විභාගය සඳහා පැමිණිලිකාරිය පෙනීසිට ඇති අතර, එම තරග විභාගයේ ප්‍රතිඵල මත 2021.03.16 දින සම්මුඛ පරීක්ෂණයකට පෙනීසිටින ලද බවත්, එම සම්මුඛ පරීක්ෂණයේ තීරණය පැමිණිලිකාරිය වෙත නොලැබුණු බැවින්, තොරතුරු දැන ගැනීමේ පනත යටතේ කරන ලද විමසීමකදී, පැමිණිලිකාරිය අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති බවට දැනගැනීමට හැකිවූ බවත් දක්වා ඇත.

අදාළ සේවා ව්‍යවස්ථාව අනුව එනම්, ව්‍යවස්ථාවේ 7(3) හි 1:2:1 වන කොටසේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් වන්නේ, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් උපාධියක් ලබාතිබීම හා එලෙසම පිළිගත් ආයතනයක පරිගණක විද්‍යා/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම වන බවත්, එම සුදුසුකම් දෙකම පැමිණිලිකාරිය විසින් සපුරා ඇති බවත් පැමිණිලිකාරිය දක්වා ඇත. එසේ තිබියදී අදාළ උසස්වීම නොලැබීම තුළින් පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බව මෙම පැමිණිල්ලෙන් සඳහන් කරයි.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත විසින් කරුණු වාර්තා කරමින් දක්වා ඇත්තේ, බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I වන පන්තියේ III වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා එක් පුරප්පාඩුවක් ඇති බවට ප්‍රධාන ලේකම්වරයා විසින් 2018.11.14 දිනැති ලිපිය මඟින් වාර්තා කර ඇති බවත්, ඒ අනුව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය පරිදි බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණික සේවා ව්‍යවස්ථාවේ 7 (1) හි සඳහන් විධිවිධාන වලට පරිබාහිරව 7:4:1 වගන්තියට අනුකූල වන සේ විවෘත තරගවි භාගයකින් උක්ත තනතුරට බඳවා ගැනීම සිදුකිරීමටත්, සීමිත තරග විභාගයට පෙනීසිටීමට සුදුසුකම් සපුරා ඇති තරගකරුවන්ට ද එම විවෘත තරග විභාගය සඳහා පෙනීසිටීමටත් බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/5/15(IV) හා 2018.11.14 දිනැති ලිපිය මඟින් ආණ්ඩුකාරවරයා විසින් අනුමැතිය ලබාදී ඇති බවයි.

ඒ අනුව 2019.04.02 දින හා 2019.01.11 දිනැති බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය පරිදි සීමිත තරග විභාගයට පෙනීසිටීමට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට ද විවෘත තරග විභාගය සඳහා පෙනීසිටීම සඳහා අවස්ථාව ලැබෙන සේ අයදුම්පත් කැඳවීමට තීරණය කරන ලද බවත්, ඒ අනුව උක්ත තනතුරට අදාළ බඳවා ගැනීමේ තරග විභාගය 2019.04.05 දින පවත්වා ඇති අතර, එම විභාගය සඳහා අයදුම්කරුවන් 06 දෙනෙක් සහභාගී වූ අතර, ඉන් එක් අයදුම්කරුවෙකු පමණක් විභාගයෙන් සමත් වී අනෙක් අයදුම්කරුවන් 05 දෙනා අසමත් වු බවත් දක්වා ඇත.

සමත්වූ අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා 2019.07.25 දින සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ අතර, ඉන් සුදුසුකම් ලත් අයදුම්කරු හට පත්වීම ලබාදීම අනුමත කිරීමට සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය ලබාගැනීම සඳහා කොමිසන් සභා පත්‍රිකාව 2019.08.02 වන දින ඉදිරිපත් කළ බවත්, ඒ අනුව කරුණු සලකා බැලූ කොමිෂන් සභාව සේවා ව්‍යවස්ථාවේ 7 (1) වගන්තිය පරිදි අභ්‍යන්තර අයදුම්කරුවන් සුදුසුකම් නොලබන බව පරිපාටිය තුළ සලසා ඇති විධිවිධාන පරිදි තහවුරු කර නොගෙන අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් එකම ලිඛිත පරීක්ෂණයක් සඳහා යොමු කිරීම මඟින් එකී තනතුර සඳහා අයදුම්කරුවෙකු තෝරාගෙන ඇති බවට නිරීක්ෂණය වන බවත්, එම ක්‍රියාවලිය පරිපාටිගත තේරීම් ක්‍රියාවලියට අනුගත නොවීම මත මූලික අයිතිවාසිකම් නඩු නිමිත්තක් ඇතිවීමට ඉඩ ඇති බවට සලකා බැලීමෙන් පසුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් විකල්ප යටතේ මෙම බඳවා ගැනීම සිදුකිරීමට පියවර ගන්නා ලෙසට උපදෙස් ලබාදුන් බවත් සඳහන් කර ඇත. එනම්,

1. දැනට අනුමත පරිපාටියේ විධිවිධාන තුළ කටයුතු කිරීමටත්,

2. පරිපාටි විධිවිධාන තුළ මෙකී තෝරා ගැනීම අයෝග්‍ය යැයි හැඟෙන්නේ නම්, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දැනට අනුමත බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීමට ඉදිරි කටයුතු සිදුකිරීමටත්ය.

ඒ අනුව එම බඳවා ගැනීම අනුමත නොකරන බවට අයිතම අංක 2019/67/14 හා 2019.08.09 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණයෙන් දැනුම්දී ඇත.

එකී කොමිෂන් සභා තීරණයට සමගාමීව උක්ත කරුණු සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් හා බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් සමඟ 2019.10.23 දිනැතිව සාකච්ඡාවක් පවත්වන ලද බවත්, එකී සාකච්ඡාව පරිදි ව්‍යවස්ථාවට අනුව සීමිත තරග විභාගයක් පවත්වා අදාළ පුරප්පාඩුව පිරවීමටත්, එසේ කිරීමට නොහැකි නම් විවෘත තරග විභාගයක් පවත්වා පුරප්පාඩු පිරවීමටත් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාදී ඇති අතර, 1 වන පන්තියේ III වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා පැවති පොදු විභාගයේ පරිපාටියට පටහැනි වීම නිසා එම විභාගය අවලංගු කළ බවත්, එසේ එම විභාගය අවලංගු කරනු ලැබුවේ විභාග පරිපාටියට පටහැනිවීම හේතුවෙන් බවත්, පැමිණිලිකාරිය විසින් මෙම විභාගය අවලංගු කරන ලෙසට කරන ලද අභියාචනයේ ප්‍රතිඵලයක් ලෙස නොවන බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

ඒ අනුව 2019.11.26 දිනැතිව අභ්‍යන්තර නිවේදනයක් මඟින් සීමිත තරග විභාගයක් පැවැත්වීමට අයදුම්පත් කැඳවූ බවත්, ඒ අනුව ලැබී තිබූ අයදුම්පත් තුන අතුරින් අයදුම්පත් දෙකක්ම සුදුසුකම් සපුරා නොමැති බැවින් ආයතන ප්‍රධානියා විසින් නිර්දේශ කර නොතිබූ අතර, පැමිණිලිකාරියගේ අයදුම්පත පමණක් ආයතනය ප්‍රධානියා විසින් නිර්දේශ කර තිබූ බවත් දක්වා ඇත.

නමුත්, එක් අයෙකුට පමණක් මෙම විභාගය පැවැත්වීම යෝග්‍ය නොවන බවට කොමිෂන් සභාව තීරණය කර තිබූ බැවින්, නැවතත් අයදුම්පත් කැඳවීම සුදුසු බවට තීරණය වූ බවත්, ඒ අනුව 2020.08.21 දින නැවත සීමිත ධාරාව යටතේ අයදුම්පත් කැඳවීමට නිවේදන යොමු කරන ලද බවත්, මුල් අවස්ථාවේදී ආයතනය ප්‍රධානියා

විසින් නිර්දේශ නොකරන ලද අයදුම්පත් දෙක නැවත වරක් ඉදිරිපත් කර තිබූ බවත්, ප්‍රධානියා විසින් නිර්දේශ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමටත් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් තිදෙනා අතරින් එක් අයෙකු පමණක් බඳවා ගැනීමේ නිවේදනය ප්‍රකාරව නිවැරදිව අයදුම්පත් යොමු කර තිබූ බැවින්, අදාළ විභාගය පවත්වා සේවා ව්‍යවස්ථාවේ සඳහන් බඳවා ගැනීමට අදාළ විධිවිධාන සපුරාලීම මත එම බඳවා ගැනීමට අනුමැතිය ලද බවත් දක්වා ඇත. 2021.01.06 දින පැමිණිලිකාරිය සඳහා පමණක් සීමිත තරග විභාගය පවත්වා ඇති අතර, ඒ අනුව පැමිණිලිකාරිය ඉන් සමත්වී ඇති බවත් දක්වා ඇත.

එහෙත්, 2021.03.16 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකාරියගේ සුදුසුකම් පරීක්ෂා කිරීමේදී අදාළ සුදුසුකම් සපුරා නොතිබීම මත එනම්, බඳවා ගැනීමේ නිවේදනයේ 5 වන ඡේදයේ සඳහන් බඳවා ගැනීමට අදාළ 5.1.1, 5.1.2 සහ 5:1:3 වගන්ති යටතේ සුදුසුකම් සපුරා නොමැති බවට නිරීක්ෂණය වූ බවත් වැඩිදුරටත් දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකාරිය බඳවා ගැනීමේ නිවේදනයේ 5:1:4 වගන්තිය යටතේ සුදුසුකම් සපුරා ඇත්ද යන්න සහතික කර ගැනීම සඳහා ඇය විසින් කොළඹ විශ්ව විද්‍යාලය මඟින් හදාරා ඇති පශ්චාත් උපාධි ඩිප්ලෝමාව SLQF හා NVQ මට්ටම අතර ගැලපීමක් සිදුකල හැකිද යන්න අදාළ විශ්ව විද්‍යාලය මඟින් විමසා සති දෙකක් තුළ ලිඛිතව තහවුරු කර ඉදිරිපත් කරන ලෙසට පැමිණිලිකාරියට උපදෙස් දුන් බවත් සඳහන් කර ඇත. ඒ අනුව ඇය විසින් විශ්ව විද්‍යාලය මඟින් ලබාදුන් තහවුරුව සලකා බැලූ කොමිෂන් සභාවේ තීරණය ප්‍රකාරව හා ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත අදාළ ව්‍යවස්ථාවට අනුව 1 පන්තියේ 3 වන ශ්‍රේණියේ සීමිත බඳවා ගැනීමට අදාළව පැමිණිලිකාරිය සුදුසුකම් සපුරා නොමැති බවට තීරණය කරන ලද බව සඳහන් කරයි.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් සිදුකරන ලද අතර, එහිදී කරුණු විමසීමේදී වගඋත්තරකාර පාර්ශවය වැඩිදුරටත් කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිලිකාරිය 2020.07.13 දිනැතිව කොමිෂන් සභාව විසින් යොමු කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 වන පන්තියේ 3 වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම සඳහා සීමිත පදනම මත නිකුත් කරන ලද අයදුම්පත් කැඳවන ලද නිවේදනය අනුව කොමිෂන් සභාව වෙත අයදුම්පත් නිකුත් කර ඇති බවයි.

ඒ අනුව, බස්නාහිර පළාත් රජය සේවයේ තොරතුරු හා තාක්ෂණික සන්නිවේදන සේවා ව්‍යවස්ථාව අනුව පැවැත්වූ තරග විභාගයෙන් සමත්ව 2021.03.16 දිනැතිව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද නමුත්, සම්මුඛ පරීක්ෂණ නිර්දේශය අනුව පැමිණිලිකාරිය අදාළ බඳවා ගැනීමේ නිවේදනයේ 5:1:1, 5:1:2 සහ 5:1:3 හි සඳහන් අදාළ සුදුසුකම් සපුරා නොමැති බවත්, 5:1:4 ට අදාළව ඇය විසින් හදාරා ඇති පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව SLQF හා NVQ මට්ටම් අතර ගැලපීමක් කළ හැකිද යන්න අදාළ විශ්ව විද්‍යාලය මඟින් විමසා ලිඛිතව තහවුරු කරන ලෙසට උපදෙස් ලබාදී ඇති බවත් දක්වයි. පැමිණිලිකාරිය නිවේදනයේ 5:1:1, 5:1:2 සහ 5:1:3 හි සඳහන් සුදුසුකම් සපුරා නොමැති බැවින්, ඇයගේ සුදුසුකම් 5:1:4 යටතේ ගලපා පැමිණිලිකාරියට සහනයක් සැලසිය හැකිද යන්න පිළිබඳව සලකා බැලීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඇයට අවස්ථාවක් ලබාදුන් බවයි. ඒ අනුව පැමිණිලිකාරිය විසින් 2021.04.28 දිනැතිව යොමු කරන ලද ඊමේල් පණිවිඩය අනුව කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පැමිණිලිකාරිය විසින් හදාරා ඇති පශ්චාත් උපාධි ඩිප්ලෝමා

පාඨමාලාව SLQF මට්ටම සමඟ ඒ අවස්ථාවේදී ගැලපීමක් සිදු කර නොමැති බවට දන්වා ඇති බැවින්, කොමිෂන් සභාව විසින් මෙම පැමිණිලිකාරිය අදාළ සේවා ව්‍යවස්ථාවට අනුව සුදුසුකම් සපුරා නොමැති බවට දක්වා ඇය බඳවා ගැනීම ප්‍රතික්ෂේප කිරීමත්, ඒ අනුව සේවා ව්‍යවස්ථාවේ 7 (1) අනුව ඉදිරි කටයුතු සිදුකරන ලෙසත් කොමිෂන් සභාවේ ලේකම් විසින් උපදෙස් ලබා දී ඇති බවත්, ඒ අනුව බඳවා ගැනීමේ නිවේදනයේ 5:1:4 යටතේ පැමිණිලිකාරියගේ සුදුසුකම් ගැලපිය නොහැකි බවට ද දක්වා ඇත.

තවද, 5:1:3 ව්‍යවස්ථාව අනුවද අදාළ සුදුසුකම් සපුරා නොමැති බව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඇය වෙත දන්වා ඇති අතර, ඇය හදාරා ඇති උපාධි පාඨමාලාවේ 1/3 කොටසක් පරිගණක විද්‍යා හෝ තොරතුරු තාක්ෂණය යටතේ නොමැති බවට ඇයගේ විස්තරාත්මක උපාධි සහතිකය මගින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තහවුරු කර ගෙන ඇති බවද දක්වා ඇත.

ඒ අනුව ඇය 5:1:2 යටතේ ද අදාළ සුදුසුකම් සපුරා නොමැති බවට තහවුරු කරගෙන ඇති බවද, එමෙන්ම, 5:1:1 හි සඳහන් අදාළ සුදුසුකම් වලට අනුව පැමිණිලිකාරිය 2 වන පන්තියේ 2 වන ශ්‍රේණියේ නිලධාරියෙක් වන බවත්, ඊට අදාළ සුදුසුකම් ද සපුරා නොමැති බවට සඳහන් කරයි. ඒ අනුව සම්මුඛ පරීක්ෂණයේදී අදාළ සුදුසුකම් සපුරා නොතිබීම මත ඇය වෙත එම උසස්වීම ලබාදී නොමැති බවට දන්වා ඇත.

පැමිණිලිකාරිය මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ, මේ වනවිට ඇය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික සේවයේ 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති බවයි. ඒ අනුව සහකාර අධ්‍යක්ෂක 1 වන පන්තියේ 3 වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුරට සුදුසුකම් සපුරා ඇති බැවින්, අදාළ තනතුර තමාට ලබාදිය හැකි බවයි.

වගඋත්තරකරුවන් මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම නව තත්ත්වය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ ලේකම් සමඟ සාකච්ඡා කොට පැමිණිලිකාරිය හට සහනයක් ලබාදීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත වාර්තා කළ හැකි බවයි.

ඒ අනුව නැවත 2023.03.30 දින පරීක්ෂණයක් සඳහා පාර්ශවයන් කැඳවා ඇති අතර, ඉහත තත්ත්වය යටතේ පැමිණිලිකාරියට සහනයක් ලබාදීම සම්බන්ධයෙන් වන කරුණ පිළිබඳව වගඋත්තරකරුවන් කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ, මේවනවිට රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් නවතා ඇති බැවින් ද, සීමිත තරග විභාගයක් පැවැත්වීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ඉල්ලා බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් යවා ඇති බැවින්ද, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට හැකියාවක් නොමැති බවයි.

කෙසේ වෙතත්, එදින සාකච්ඡාවේදී ඉදිරිපත් වූ කරුණු වලට අනුව ඉහත ප්‍රශ්නගත තනතුරට සුදුසුකම් සපුරා ගැනීමට අදාළව පැමිණිලිකාරිය තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳව අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා එනම්, NVQ 7 වන මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීමට අදාළව පැමිණිලිකාරිය කොළඹ විශ්ව විද්‍යාලය මගින් ලබාගෙන ඇති පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ඉහත සුදුසුකම් වලට සමාන බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තහවුරු

කිරීමක් සිදුකර ඇති බැවින්, අදාළ උසස්වීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර කොමිෂන් සභාවේ තීරණය අනුව කටයුතු කිරීමට හැකි බවයි.

**නිරීක්ෂණ :-**

බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 7:1 අනුව බඳවා ගන්නා අනුපාතයේ ධාරාව 100% ක්ම සීමිත විය යුතු අතර, එකී සටහන් වල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 වන පන්තියේ III වන ශ්‍රේණිය යටතේ සීමිත ධාරාවෙන් බඳවා ගැනීමට නොහැකි අවස්ථාවන් වලදී විවෘත ධාරාවන් යටතේ බඳවා ගැනේ. මෙම තනතුර සඳහා එක් පුරප්පාඩුවක් තිබී ඇති අතර, ඒ සඳහා සීමිත ධාරාව යටතේ විභාගයක් පැවැත්වීමට අදාළ වගඋත්තරකරුවන් තීරණය කිරීමෙන් අනතුරුව අයදුම්කරුවන් තිදෙනෙක් ඉදිරිපත් වී ඇති නමුත්, පැමිණිලිකාරිය පමණක් අදාළ සුදුසුකම් සපුරා තිබූ බැවින්, ඇය එම විභාගයෙන් සමත් වී ඇති බවට 2021.03.03 දරණ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ලිපිය මඟින් නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් විසින් නැවත විවෘත තරග විභාගයකින් අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමට සූදානම් වූ අවස්ථාවේදී බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ නියමයෙන් එම කටයුතු අවලංගු කර ඇති බවද නිරීක්ෂණය වේ.

අදාළ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කරනු ලබන තෙක් සේවා ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියාකිරීමට ආණ්ඩුකාරවරයාට හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලයක් නොපවතින අතර, එසේ තිබියදී එකී සේවා ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියාකිරීම නොකළයුතුව තිබිණි.

1 වන පන්තියේ III වන ශ්‍රේණිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද 7:4:2:2:1 සහ 7:4:2:2:3 හි සඳහන් කර ඇත.

මේ අනුව පැමිණිලිකාරිය තරග විභාගයෙන් සමත් වී සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ඇති අතර, සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකාරියගේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ අවම වශයෙන් 1/3 කොටසක් පරිගනක විද්‍යා තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය යන කරුණට අදාළ ද යන්න තහවුරු කර ගැනීම සඳහා SLQF හා NVQ මට්ටම අතර ගැලපීම කළ හැකිද යන්න අදාළ විශ්ව විද්‍යාලය මඟින් විමසා ලිඛිත තහවුරු කිරීමක් සති දෙකක් තුළ සිදුකරන ලෙසට පැමිණිලිකාරියට උපදෙස් ලබාදී ඇති නමුත්, පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව SLQF මට්ටම සමඟ එම අවස්ථාවේදී ගැලපීමක් සිදුකර නොමැති බවට අදාළ විශ්ව විද්‍යාලය විසින් පැමිණිලිකාරියට දන්වා ඇත.

පැමිණිල්ල සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ දී කරන ලද පරීක්ෂණය අතරතුරදී වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකාරිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියේ නිලධාරිනියක් බවට උසස්වීම් ලබා ඇති බැවින්, සේවා ව්‍යවස්ථාවේ 5:1:1 සහ 5:1:2 යටතේ අදාළ සුදුසුකම් සපුරා ඇති බවත්, ඒ අනුව සේවා ව්‍යවස්ථාවේ 1 වන පන්තියේ III වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම් ලබා ඇති බවයි.

එසේම, ව්‍යවස්ථාවට අදාළ ශ්‍රේණියට බඳවා ගැනීමේ සුදුසුකම වන පැමිණිලිකාරිය තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා NVQ 7 මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීම යටතේ පැමිණිලිකාරිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ලබාගෙන ඇති පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව ඉහත සුදුසුකම් වලට සමාන බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තහවුරු කිරීමක් කරන්නේ නම්, අදාළ ව්‍යවස්ථාවට අනුව පැමිණිලිකාරියට උසස්වීම් ලබාදීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට හැකි බවට දන්වා ඇත.

මේ වනවිට පැමිණිලිකාරිය ඊට අදාළ එනම්, ව්‍යවස්ථාවේ 7:4:1:2:1 හි සඳහන් NVQ 7 මට්ටම පැමිණිලිකාරියගේ පශ්චාත් උපාධියට අනුගත වන බවට සහතික කර කොළඹ විශ්ව විද්‍යාලය විසින් දන්වා ඇති බවට නිරීක්ෂණය වේ.

එසේම, මෙම පශ්චාත් උපාධිය SLQF Level 8 මටටමේ පවතින බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සහතික කර ඇති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරියව 2019.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තොරතුරු තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියේ නිලධාරිනියක් බවට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2021.11.30 දිනැති ලිපිය මගින් පත්කර ඇති අතර, ඒ අනුව අදාළ සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ දිනය වන 2021.03.16 දින වනවිට ඇය 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියේ නිලධාරිනියක් වේ.

මේ අනුව පැමිණිලිකාරිය මේ වනවිට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 1 වන පන්තියේ 1 වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවද පැහැදිලි වේ. ඒ අනුව අදාළ සේවා ව්‍යවස්ථාව අනුව එනම්, ව්‍යවස්ථාවේ 7(3) හි 1:2:1 වන කොටසේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් වන, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් උපාධියක් ලබාතිබීම හා එලෙසම පිළිගත් ආයතනයක පරිගණක විද්‍යා/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම යන සුදුසුකම් පැමිණිලිකාරිය විසින් සපුරා තිබියදීත් බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 1 වන පන්තියේ III වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂක තනතුර ලබා නොදීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

පැමිණිලිකාරිය මේවනවිට බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 1 වන පන්තියේ III වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂක තනතුර සඳහා අදාළ සුදුසුකම් එනම්, 7:4:1:2 හි සඳහන් සුදුසුකම් සහ 7:4:2 ට අදාළ සුදුසුකම් සපුරා ඇති බැවින්, ඇයට එම තනතුර ලබාදීමට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කටයුතු කළ යුතුය.

2023.11.30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. ආණ්ඩුකාරතුමා,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලය,
10 වන මහල, අංක 628,
ජනජය ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

02. පළාත් පාලන කොමසාරිස් (බ.ප)
පළාත් පාලන දෙපාර්තමේන්තුව,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

02. නාගරික කොමසාරිස්,
කොළඹ මහනගර සභාව,
කොළඹ 07.

B/